00016

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන - 2024/2025
අවසාන පරීක්ෂණය - 2025
**SNP8244/SNP8334- විශේෂ තත්ත්වයන් සහ ඉගෙනුම් අවශ්‍යතා පිළිබඳ හැඳින්වීම**
කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2025.07.25 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්න වලටද 2 වන කොටසින් ඕනෑම ප්‍රශ්න තුනකටද (3) පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

1. "විශේෂ අධ්‍යාපන අවශ්‍යතා" යන පදය නිර්වචනය කර විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ අරමුණු තුනක් (03) සඳහන් කරන්න.

2. දරුවෙකුට දෘශ්‍ය ඌනතාවක් ඇතිබව පෙන්නුම් කරන පොදු ලක්ෂණ හෝ ඔවුන් කරන පැමිණිලි පහක් (05) ලැයිස්තුගත කරන්න.

3. ශාරීරික ආබාධ සහිත දරුවෙකුට ඵලදායී ලෙස සහාය වීම සඳහා ගුරුවරයෙකුට ක්‍රියාත්මක කළ හැකි පන්ති කාමර වෙනස් කිරීම් පහක් (05) විස්තර කරන්න.

4. කථන ආබාධ සහ භාෂා ආබාධ අතර වෙනස්කම් පෙන්වා දෙන්න.

5. "සංවේදක ස්නායු ශ්‍රවණාබාධ" යන යෙදුම පැහැදිලි කරන්න.

6. චර්යාමය ආබාධයක ප්‍රධාන දර්ශක/ ලක්ෂණ තුනක් (03) ලැයිස්තුගත කරන්න.

7. ඩවුන් සින්ඩ්‍රෝම තත්ත්වය සහිත දරුවන් තුළ දක්නට ලැබෙන ගති ලක්ෂණ මොනවාද?

8. ඩිස්ග්‍රාෆියා තත්ත්වයේ ප්‍රධාන ලක්ෂණ ලැයිස්තු ගත කරන්න.

(ලකුණු 05x08 = ලකුණු 40)

## 2 වන කොටස

9. (i) 'බුද්ධිමය ඌනතාව' යන පදය නිර්වචනය කරන්න. (ලකුණු 04)

 (ii) බුද්ධිමය ඌනතා සහිත සිසුන් පන්ති කාමරය තුළ මුහුණ දෙන අභියෝග තුනක් (03) විස්තර කරන්න. (ලකුණු 06)

 (iii) ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේදී බුද්ධිමය ඌනතා සහිත සිසුන්ට සහාය වීම සඳහා ගුරුවරුන්ට භාවිත කළ හැකි නව්‍ය හා ඵලදායී උපාය මාර්ග යෝජනා කරන්න. (ලකුණු 10)



49

10. (i) ඔටිසම් පරාසයික අක්‍රමතාව (ASD) කෙටියෙන් නිර්වචනය කරන්න. (ලකුණු 03)

(ii) ඔටිසම් පරාසයික අක්‍රමතා තත්ත්වය ඇති පුද්ගලයන් තුළ බහුලව දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ සහ හැසිරීම් ඉස්මතු කරන්න. (ලකුණු 07)

(iii) ඔටිසම් පිළිබඳ මහජනතාවට තිබිය හැකි වැරදි වැටහීම් **තුනක් (03)** ලැයිස්තුගත කර, ඔටිසම් තත්ත්වය සහිත පුද්ගලයන්ව සමාජයට අන්තර්කරණය කර ගැනීමට සහ ඔවුන්ට සහාය වීමට හැකි ආකාර **තුනක් (03)** පැහැදිලි කරන්න. (ලකුණු 10)

11. **"සුභග සහ දක්ෂ සිසුන් හට සහයෝගය නොමැති වුවද විශිෂ්ට ලෙස කටයුතු කළ හැකි බව බොහෝ විට උපකල්පනය කෙරේ."**

(i) අධ්‍යාපනික සන්දර්භය තුළ "සුභග" (Gifted) සහ "දක්ෂ" (Talented) යන පද අර්ථ දක්වන්න. (ලකුණු 04)

(ii) මෙම සිසුන් හට සාමාන්‍ය පන්ති කාමර පරිසරයක් තුළ මුහුණ දීමට සිදුවන විශේෂිත අභියෝග තුනක් (03) විස්තර කරන්න. (ලකුණු 06)

(iii) සුභග සිසුන්ගේ ශාස්ත්‍රීය සහ හා චිත්තවේගීය අවශ්‍යතා පෝෂණය කරන උපකාරක ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

12. පහත සඳහන් සිද්ධිය කියවා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

*සැම් යනු විද්‍යා අතහදා බැලීම් කිරීමට සහ සිය දෑතින් දේවල් සෑදීමට ප්‍රිය කරන දක්ෂ හා නිර්මාණශීලී සිසුවෙකි. කෙසේ වෙතත්, ඔහුට කියවීම අපහසු වන අතර, බොහෝ විට අකුරු පැටලී යන අතර, අක්ෂර වින්‍යාසය හා ලිවීමේ දුෂ්කරතාවයන්ට මුහුණ දෙයි. ශබ්ද නගා කියවීමට අවශ්‍ය විට ඔහුට නොසන්සුන් බවක් දැනෙන අතර ඇතැම් විට පන්ති වේලාවේදී කියවීම අවශ්‍ය වන කාර්යයන් මගහරියි.*

(i) ඉහත විස්තර අනුව, සැම් හට තිබිය හැකි තත්ත්වය හඳුනාගෙන, එහි ප්‍රධාන ලක්ෂන දෙකක් ලැයිස්තුගත කරන්න. (ලකුණු 04)

(ii) මෙම තත්ත්වය සාමාන්‍ය පන්ති කාමරයක් තුළ සැම්ගේ ඉගෙනීමට බලපාන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) සැම් වැනි සිසුන්ට උපකාර කිරීම සඳහා පන්ති කාමර උපාය මාර්ග **තුනක් (03)** යෝජනා කර පැහැදිලි කරන්න. එමඟින් කියවීම් සහ ලිවීමේ ක්‍රියාකාරකම් වලදී ඔවුන්ට විශ්වාසයක් සහ අන්තර්කරණය වී ඇති බවක් දැනෙන බව සහතික කරන්න. එක් එක් උපාය මාර්ග සඳහා උදාහරණ සපයන්න. (ලකුණු 10)

13. (i) 'ඉගෙනුම් බාධා' යන යෙදුමෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 03)

(ii) ප්‍රජාවේ ඇති ආකල්ප අන්තර්කරණ අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීමට බලපාන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii) ඔබේ පාසල අන්තර්කරණ අධ්‍යාපන ප්‍රතිපත්තියක් හඳුන්වා දෙන බව සිතන්න. ගුරුවරයෙකු ලෙස, විවිධ අවශ්‍යතා ඇති දරුවන් සඳහා සහායක පාසල් පරිසරයක් නිර්මාණය කිරීම පිණිස අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳව සෙසු ගුරුවරුන් අතර දැනුවත්භාවය ඇති කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. ඔබේ ප්‍රවේශය නිදර්ශනය කිරීමට ප්‍රායෝගික උදාහරණ ඇතුළත් කරන්න. (ලකුණු 10)

14. (i) ශිෂ්‍යයෙකුගේ පාසල් සහභාගීත්වයට බලපාන උග්‍ර සෞඛ්‍ය තත්ත්වයන් දෙකක් නම් කර ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) මාංශපේශි ආසාත තත්ත්වය (Muscular Dystrophy) ශිෂ්‍යයෙකුගේ දෛනික ක්‍රියාකාරීත්වයට සහ පාසල් ක්‍රියාකාරකම්වලට බලපාන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) පන්ති කාමර ගුරුවරයෙකු ලෙස, ශාරීරික ආබාධ තත්ත්වයන් සහිත ශිෂ්‍යයෙකුගේ අවශ්‍යතාවලට සහාය වෙමින් ස්වාධීනත්වය සහ අන්තර්කරණය ප්‍රවර්ධනය කිරීම සඳහා ඔබ මෙම පන්ති කාමරය සංවිධානය කරන්නේ කෙසේදැයි විස්තර කරන්න. ප්‍රායෝගික උදාහරණ ඇතුලත් කරන්න. (ලකුණු 10)

*-සියලුම හිමිකම් ඇවිරිණි.-*